# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
த.பெ.1559, பொது திறைசேரி, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு , கொழும்பு 01 ,இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Planning and Economic Development, Colombo 01, Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | +94 11 2484600<br>+94 11 2484700 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | +94 11 2484970<br>+94 11 2320042 | වෙබ් අඩවිය<br>இணையதளம்<br>Website | www.treasury.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | TO/CFM/01/06/02(i) | ඔබේ අංකය<br>உமது இல<br>Your | | දිනය<br>திகதி<br>Date | 2025.12. 10 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා අයවැය ඇස්තමේන්තු මගින්
ප්‍රතිපාදන සලසා දෙනු ලබන රාජ්‍ය ව්‍යවසාය හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත

**<u>රාජ්‍ය ව්‍යවසායන් හා ව්‍යවස්ථාපිත මණ්ඩල වෙත අය වැය ප්‍රතිපාදන මත වියදම් කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරනු ලබන අරමුදල් සම්බන්ධවයි.</u>**

වාර්ෂික විසර්ජන පනත මගින් එක් එක් රාජ්‍ය ආයතන සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන පදනම් කරගනිමින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන නිර්දේශ මත පදනම්ව මෙම දෙපාර්තමේන්තුව විසින් ඔබ ආයතනය වෙත පුනරාවර්ථන හා ප්‍රාග්ධන ලෙස මුදල් ප්‍රදාන නිදහස් කරනු ලැබේ.

02. එක් එක් රාජ්‍ය ආයතන වෙත මුදල් ප්‍රදාන ලබා දීම් හා ඒවා අදාල වැය ශීර්ෂ වලට ගිණුම් තැබීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරන බැවින්, එම එකිනෙක ආයතන සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන යටතේ ලබා දුන් මුදල් ප්‍රදාන අදාල කාරණයට යෙදවීම පිළිබඳව හා පසු විපරම් සිදු කිරීම පහසු කර ගැනීම සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දීමට තීරණය කර ඇත.

03. එබැවින්, මාසිකව නිදහස් කළ මුදල් ප්‍රදාන සම්බන්ධව සහ ඒවා වැය කළ ආකාරය දැක්වෙන පිරිදි මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කළ වාර්තාව 2025 ජනවාරි සිට 2025 නොවැම්බර් 30 දක්වා එක් වාර්තාවක් 2025.12.15 දිනට පෙර යොමු කරන ලෙස දන්වන අතර, ඉන් අනතුරුව සෑම මාසයක් සඳහාම මෙම වාර්තාව ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

04. තවද, ඔබ ආයතන වෙත අරමුදල් නිදහස් කර ඇති නමුත්, ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 හි අංක 11 හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2024 හි අංක 14 මගින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව අපේක්ෂිත කාර්යය මෙම වසර තුල සිදු නොවූ හෝ අදාල කාර්යය නිම වීමෙන් පසු තව දුරටත් ඉතිරිවන මුදල් පවතී නම් එම මුදල් අදාල වැය විෂයන්ට අධිහාර කිරීම සඳහා මුදල් වර්ෂය අවසන් වීමට පෙර භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලංකා බැංකුව, තැපේ‍රාබේන් ශාඛාවේ ගිණුම් අංක 2026450 හෝ මහජන බැංකුව, යුනියන් පෙදෙස ශාඛාවේ ගිණුම් අංක 014-1-001-3-0110432 වෙත බැර කර, ඒ බව මෙම දෙපාර්තමේන්තුව දැනුවත් කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දැනුම්දෙනු ලැබේ.

**ජුඩ් නිලුක්ෂාන්**
අධ්‍යක්ෂ ජනරාල් ( වැ.බ.)

<u>පිටපත -</u>
විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය -කරු. අ.ක.ස.

**2025 ජනවාරි සිට 2025 නොවැම්බර් මාසය දක්වා වියදම් වාර්තාව** රු

| | | | |
|---|---|---|---|
| 2025 වර්ෂය ආරම්භයේ ඉතිරි මුදල | | | xxx |
| | | | |
| <u>වැටුප් වියදම්</u> | | | |
| ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා ලබා දුන් ප්‍රදාන මුදල | | xx | |
| ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා වියදම | | | |
| • වැටුප් | X | | |
| • වැටුප් සමඟ ගෙවන දීමනා | X | | |
| • වෙනත්( සඳහන් කරන්න) | X | | |
| • මුළු වැටුප් වියදම | x | (xx) | |
| ඉතිරිය | | | x |
| | | | |
| <u>වෙනත් පුනරාවර්තන වියදම්</u> | | | |
| ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා ලබා දුන් ප්‍රදාන මුදල | | xx | |
| ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා වියදම | | | |
| • විදුලිය හා ජලය | x | | |
| • ගොඩනැගිලි කුලී | x | | |
| • ආරක්ෂක හා පවිත්‍රතාව | x | | |
| • ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතාව | x | | |
| • නඩත්තු හා ඉන්ධන වියදම් | x | (xx) | |
| • ............................................. | | | |
| • ................................................. | | | |
| ඉතිරිය | | | x |
| | | | |
| <u>ප්‍රාග්ධන වියදම</u> | | | |
| ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා ලබා දුන් ප්‍රදාන මුදල | | xx | |
| ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා වියදම | x | | |
| • යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | x | | |
| • ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | x | | |
| • වාහන අළුත්වැඩියා | x | | |
| • කාර්ය මණ්ඩල පුහුණු | x | | |
| • ගොඩනැගිලි ඉදිකිරීම් | x | | |
| • .................................................. | | (xx) | |
| | | | |
| ඉතිරිය | | | x |
| | | | |
| නොවැම්බර් මාසය අවසානයේ ඉතිරි මුදල | | | xxx |
| භාණ්ඩාගාරය වෙත ආපසු එවූ මුදල ( දිනය / චෙක්පත් අංකය) | | | (xx) |
| තවදුරටත් ඉතිරි ශේෂය | | | xxx |

සකස් කලේ -

පරීක්ෂා කලේ -

සහතික කලේ-

(අධ්‍යක්ෂ (මුදල්) අත්සන)

නිල මුද්‍රාව